ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 6 වන මට්ටම

ප්‍රථම අඛණ්ඩ ඇගැයීම් පරීක්ෂණය – 2006

වාණිජ නීතිය – **LWU 4324 / 3324**

කාලය - විනාඩි 40 යි

---

දිනය: 2006 සැප්තැම්බර් මස 06 වන දින වේලාව: ප.ව. 3.00 සිට ප.ව. 3.40 දක්වා

---

අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.

1. භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් සඳහා 1896 අංක 11 දරණ භාණ්ඩ විකිණීමේ ආඥාපණතේ ඉදිරිපත් කර ඇති අර්ථ නිරූපණය මගින් භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් සහ භාණ්ඩ විකිණීමේ ගිවිසුමකට ආසන්න වශයෙන් සමාන වන්නා වූ වෙනත් ගණුදෙනු අතර වෙනස පැහැදිලි කරයි

   අදහස් දක්වන්න.

2. පහත සඳහන් ගණුදෙනුවල නෛතික ප්‍රතිඵල තීරණය කරන්න. අදාළ ව්‍යවස්ථාපිත විධිවිධාන හා තීරණය කරනු ලැබූ නඩු තීන්දු ඇත්නම් ඒවා ඇසුරෙන් ඔබේ පිළිතුර සනාථ කළ යුතුය

   (අ) අමල් විසින් තෝරනු ලබන සැලසුමකට අනුව ජේකර් ජුවලර්ස් විසින් නිෂ්පාදනය කළ යුතු රන් මාලයක් අමල්ට විකිණීමට ජේකර් ජුවලර්ස් එකඟ විය. එම කාර්යය අමල්ගේ විවාහ මංගල්‍ය උත්සව දිනයට පෙර දිනයේ දී නිම කිරීමට ජේකර් ජුවලර්ස් එකඟ විය. අවාසනාවකට මෙන් රන් මාලය නිෂ්පාදනය කිරීමෙන් පසු ජේකර් ජුවලර්ස් ගොඩනැගිල්ල සම්පූර්ණයෙන්ම ගින්නෙන් විනාශ විය.

   (ආ) ලියාපදිංචි අංක WP ZJ 2506 දරණ ටොයෝටා කාරය වරුණගෙන් මිළ දී ගැනීමට සරත් එකඟ විය. කෙසේ වුව ද ගිවිසුමට එළඹෙන අවස්ථාවේ දී කාරය සොරා ගෙන තිබිණි.

   (ඇ) තම මිනි මයිනර් කාරය බිසරට විකිණීමට කුමාර ගිවිසුමක් ඇති කර ගත්තේය. කාරයේ මිළ සුප්‍රසිද්ධ තක්සේරුකරුවකු වූ ජෙගනාදන් විසින් තීරණය කළ යුතු බවට දෙපාර්ශවයම එකඟ විය. කෙසේ වුව ද ජෙගනාදන් සිය කාර්යය ඉටු නොකළේය.

හිමිකම් ඇවිරිණි

************